# රජරට ශිෂ්ටාචාර සමයෙහි ආරෝග්‍ය ශාලාවන්හි භාවිත ශල්‍ය වෛද්‍ය උපකරණ පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

# An Archaeological Study of Surgical Instruments Used in Hospitals during of the Period Rajarata Civilization

උල්පතගම අමිතරතන හිමි
කරුණාසේන හෙට්ටිආරච්චි
ඇලෙක්සැන්ඩර් කපුකොටුව

## Abstract

With the dissemination of Buddhism in Sri Lanka, various types of architectural buildings were created based on monasteries. Archeological evidence proves that many hospitals and medical centers related to healthcare were created among them. The primary purpose of this research is to study the surgical instruments used in those medical centers and also to examine the usefulness of surgical instruments during the Rajarata civilization and how they affected the development of health. According to the Mahavamsa, it is said that King Buddhadasa cured a snake by draining the pus from its body. This story implies that the king had a thorough knowledge of surgery. Excavation of the Mihintale hospital site, which was built during the Anuradhapura period, has found a lot of surgical instruments. Among Them are various types of blades used for cutting, fine tools used for sewing and some sharp knives. After the Anuradhapura era, with the transfer of kingdom to Polonnaruwa, these methods advanced to the very advanced level. Medicine grinding stones, scissors, surgical instruments, cutting instruments, different types of pots used for stovage

some medicine, different types of pincers, small scales used for measuring the required amount etc. were found. It is very important to pay attention to the subject of surgical instruments encountered in this way.

**Keywords:** Surgical Instruments, Cutting Blades, Scissors, Sutures

**හැඳින්වීම**

මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමග ශ්‍රී ලංකාවේ වාසය කළ මානවයාගේ මානසික ස්වස්ථතාව සංවර්ධනයෙහිලා බෙහෙවින් ධර්මය උපකිරී වූ බව දක්නට ලැබේ. යහපත් දිවිපෙවතක් ගත කිරීම සඳහා මානසික ස්වස්ථතාව මෙන් ම කායික ස්වස්ථතාව ද ඉතා වැදගත් ලක්ෂණයකි. ඒ අනුව කායික ස්වස්ථතාව දියුණු කිරීම සඳහා අනුරාධපුර මෙන් ම පොළොන්නරු යුගවල ආරාම මූලික කොට ගෙන රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන රාශියක් ආරම්භ වූ බව දක්නට ලැබේ. එසේ ආරම්භ කරන ලද වෛද්‍ය මධ්‍යස්ථානවල ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදයන් සඳහා භාවිත කරන ලද ශල්‍ය වෛද්‍ය උපකරණ පිළිබඳව මෙම අධ්‍යයනයේ දී සිදු කරනු ලැබේ.

**පර්යේෂණ ගැටලුව**

රජරට ශිෂ්ටාචාර සමයට අයත් ශල්‍ය වෛද්‍ය උපකරණවල උපයෝගිතාව කෙබඳු ද?

**පර්යේෂණ අරමුණ**

ශ්‍රී ලංකාවේ බුදු දහම ව්‍යාප්තියත් සමග ආරාම මූලික කොට ගෙන විවිධ වර්ගයේ වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි නිර්මාණය විය. ඒ අතරත සෞඛ්‍යාරක්ෂාවට සම්බන්ධ රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන රාශියක් බිහි වූ බව පුරාවිද්‍යාත්මක සාධක මගින් සනාථ වේ. එම වෛද්‍ය මධ්‍යස්ථානයන්හි භාවිත කරන ලද ශල්‍ය වෛද්‍ය උපකරණ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණයකින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා විධිමත් පර්යේෂණ ශිල්ප ක්‍රම යොදාගත යුතු බැවින් මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මූලික වශයෙන් භාවිත කරනු ලැබේ.

- පුස්තකාල අධ්‍යයනය
- ක්ෂේත්‍ර ගවේෂණය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල සතු කැණීම් භූමිවලින් හමු වී ඇති ශල්‍ය වෛද්‍ය උපකරණ පිළිබඳ තොරතුරු විධිමත් අවසරයකින් ක්ෂේත්‍රයට ගොස් අධ්‍යයනය හා විශ්ලේෂණය කිරීම
- ඉහත සඳහන් පර්යේෂණ ක්‍රම ශිල්ප භාවිත කරමින් පර්යේෂණය සිදු කිරීම.

**සාකච්ඡාව**

ලෝකයේ ඕනෑම ශිෂ්ටාචාරගත වූ මානව සමාජයක ඔවුන්ගේ දෛනික සෞඛ්‍ය කටයුතු පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් කරුණකි. ඒ අනුව සනීපාරක්ෂාව වූ කලී සත්වයාගේ පැවැත්ම උදෙසා අතිශය වැදගත් වූවකි. එය ගිහි පැවිදි දෙපක්ෂයට ම නො අඩුව තිබිය යුතු සාධකයකි. යම් සමාජයක් ක්‍රමයෙන් දියුණු වීමේ දී මෙම කටයුතු සංකීර්ණත්වයට පත් වන ආකාරය මෙන් ම එම කටයුතු ආයතන ගත වන ආකාරය හඳුනාගත හැකිය. ක්‍රි.ව. 4 වන සියවසේ සිට අනුරාධපුර හා පොළොන්නරු යුගයන්වල අවසානය දක්වා වූ කාල වකවානුව සම්බන්ධයෙන් ද මෙම ප්‍රකාශය සාධාරණ වන බව පෙනීය යි. ලිඛිත අලිඛිත හා ජනප්‍රවාද තුළ සඳහන් වන පරිද්දෙන් සෞඛ්‍ය වෘත්තිකයන්, සෞඛ්‍ය මධ්‍යස්ථාන හා ඒවායේ පරිපාලනය පිළිබඳ ස්වස්ථතාව හා බැඳුණු වෙනත් සංකල්ප පිළිබඳව ද තොරතුරු අනාවරණය වේ. ඒ අනුව සෞඛ්‍යාරක්ෂාව නොහොත් ස්වස්ථතාව පිළිබඳ විද්වතුන් විවිධාකාර අර්ථකථනයන් ඉදිරිපත් කොට තිබේ. ඒ

අනුව බෞද්ධ ශබ්ද කෝෂයෙහි ස්වස්ථ (සං + ස්වස්ථ) යහපත් බව, සැපවත් භාවය, සුඛිත බව (බෞ. ශ. කෝ, 2007 ඃ 1676). යනුවෙන් ද, පාලි සිංහල අකාරාදියේ සුඛ විහාරණය සැපසේ විසීම, සුඛ විහාරි සැපසේ වසන්නා (බුද්ධදත්ත හිමි 1998 ඃ 549). යනුවෙන් ද, ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ සමඞගිතා - සැප සහිත බව සුඛා පටිපදා, සුව වූ ප්‍රතිපදාව සුඛිත - සුව ඇති බවය (සෝරත හිමි 2006 ඃ 1101).

ත්‍රිපිටක අර්ථ කෝෂයේ සුඛ සංවත්තනිකං, දීර්ඝායුෂ පිණිස පවත්නා ''සුඛුද්‍රියං'' සුඛ උපදවන තැනැත්තිය, යහපත් තැනැත්තිය (විජිතනන්ද, 2250 ඃ 251-252). යනුවෙන් ද, විමල් හේවාමානගේ බෞද්ධ ස්වස්ථතාව යන ග්‍රන්ථයෙහි ආරෝග්‍ය, ස්වස්ථ්‍ය, ආරෝගිතා, කුසල, ආරෝග, සුස්ථතා, සුස්ථිති, වාර්ත, රෝග භාව, නිරාමයත්ව, අනාමය, කල්‍යතා, ශරීරසුව, සනීපය, නිරෝගිකම යන වදන් ස්වස්ථතා පර්යාය නාම ලෙස ව්‍යවහාර වන බව දක්වා තිබේ (හේවාමානගේ 2008 ඃ 2). ශල්‍ය වෛද්‍ය විද්‍යාව හඳුන්වා ඇත්තේ මෙලෙසිනි. "Surgery The operative branch of medicine a room where Surgical operations are performed or where medicines are prepared a surgical" "Surgeon A medical man whose profession is to cure diseases or injuries of the body by manual operation or by medical appliances employed externally or intemally as disting uished from a physician operator doctor" (සුධර්මන්, 1999: 1147).

මිනිස් සිරුරේ හටගනු ලබන රෝගාබාධ සුව කිරීමට විවිධ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබයි. ඒ අතරත ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදය සුවිශේෂි ප්‍රතිකාර ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව මිනිස් සිරුර ව්‍යච්ඡේදනය සඳහා ඉතා සියුම් තියුණු උපකරණ භාවිත කළ යුතු වේ. එම ශල්‍ය වෛද්‍ය උපකරණයන් නිර්මාණය කර ගැනීම සඳහා යකඩ තාක්ෂණය යොදා ගෙන ඇති බව දක්නට ලැබේ. යකඩ තාක්ෂණික ඥානය මිනිසාට සම්ප්‍රේෂණය වීම හේතු කොට ගෙන ඉතා දියුණු තාක්ෂණික වෛද්‍ය උපකරණ නිර්මාණය වී ඇති බව අනුරාධපුර හා පොළොන්නරු යුග දෙකෙහි ම කැණීම් මගින් පාදාගෙන ඇති වෛද්‍ය උපකරණ අධ්‍යයනය කිරීම තුළින් දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදු කර ඇති මානව ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තොරතුරු අධ්‍යයනය කිරීමේ දී එහි ජීවත් වූ මානවයා විසින් භාවිත කරන ලද තාක්ෂණික ක්‍රම එම රටේ සාමාජීය හා සංස්කෘතික වර්ධනය සඳහා ප්‍රබල දායකත්වයක් දරා ඇති බව සාක්ෂි දරයි. ප්‍රාග් ඓතිහාසික මානවයා තම දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීමට විවිධ වර්ගයේ ක්ෂුද්‍ර ශිලා මෙවලම් උපයෝගි කොට ගත් බව දක්නට ලැබේ. කාලයාගේ ඇවෑමෙන් මිනිසාගේ මොළයේ වර්ධනයත් සමග තඹ හා යකඩ තාක්ෂණය සඳහා පසුබිම සකස් වූ ආකාරයක් දැකගත හැකි වේ. රටක් සතු තාක්ෂණික දැනුම අතරින් ලෝහ තාක්ෂණයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. තාක්ෂණය පැහැදිලි ලෙස ම වඩා ප්‍රගුණ කරවන ලද ගුණයන්ගෙන් යුක්ත වන අතර වඩා සරල උපකරණ හා න්‍යෂ්ටික හෝ අනුබද්ධ පවුල් ආශ්‍රිතව භාවිත වෙමින් පැවතුණ සරල තාක්ෂණයක් බව ද අනුමාන කරයි. මේ අතරින් නිෂ්පාදන කර්මාන්තය දියුණු මට්ටමක පැවැති බව දැකගත හැකි වේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය මත පදනම් වූ සරල ගැමි සමාජයේ සිට ආර්ථික පදනම මත වර්ධනය වන නාගරීකරණයට මෙම යකඩ තාක්ෂණය ප්‍රබලව හේතු සාධක වී ඇත. ශ්‍රී ලාංකිකයන් සතු මෙම ලෝහ තාක්ෂණ පිළිබඳ දැනුම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අවශේෂ මගින් පමණක් නොව මානවවංශ අධ්‍යයනයන් තුළින් ද හෙළිදරව් කරගත හැකිය.

අමු යකඩ නමින් හැඳින්වෙන චීනච්චට්ටි ඉතා පිරිසිදු යකඩ වර්ගය යි. එහි කාබන්, සිලිකන්, මැංගනීස්, පොස්පරස් හා සල්ෆර් යන අපද්‍රව්‍ය බහුලව තිබේ. තැලීමට සහ නැමීමට අපහසු මේවා කැඩෙන සුළුය මේවායේ ද්‍රවාංකය සෙ. අ. 12000 කි. සිද්ධි යකඩ (Wrought Iron) හොඳම යකඩ වේ. මෙහි කාබන් තිබෙන්නේ 0.1-0.25% පමණි. සිලිකන්, පෝස්පරස්, සල්ෆර් වැනි අපද්‍රව්‍ය වුව ද තිබෙන්නේ 5% කට අඩු ප්‍රමාණයකි. මේවායේ තිබෙන තන්තුමය ස්වභාවය නිසා ඉතා දැඩි ය. හොඳින් තැලීමට හැකිවන අතර භංගුර නොවේ. අධික අන්වායාම ප්‍රත්‍ය බලවලට (Longitidunal Stresses) භාජනය කළ හැකිය. මේවා ශක්තිමත් බැවින් ද්‍රවාංකය ද චීනච්චට්ටිවලට වඩා වැඩි වේ. එනම් සෙ. අ. 14000 - 15000 කි. වානේවල අඩංගු කාබන් ප්‍රමාණය අනුව වර්ග 03 ක් ඇත. සාමාන්‍ය වානේ, තරමක් හොඳ වානේ හා හොඳ ම වානේ (ලගමුව, මැන්දිස්, 2016 ඃ 80-81).

1980 ශතකය අග භාගයේ දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්වීඩන් පුරාවස්තු මණ්ඩලය සමග සීගිරිය, දඹුල්ල ප්‍රදේශයේත්, ජනාවාසකරණ පුරාවිද්‍යා සහයෝගිතා ව්‍යාපෘතිය යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා බ්‍රිතාන්‍ය පුරාවිද්‍යාඥයින් සමග ඉහළ උඩවළවේ නිම්නයේ ත් සිදුකරන ලද පර්යේෂණ මගින් පුරාණ ලෝහ තාක්‍ෂණය පිළිබඳ වැදගත් සොයාගැනීම් කරන ලදී. පුරාණ ලෝහ තාක්‍ෂණය සම්බන්ධයෙන් සිදුකළ අධ්‍යයනයන් මගින් සොයාගත් සාධක අනුව දිවයින පුරා පැතිරුණු යකඩ කර්මාන්තයක් හා ඒ ආශ්‍රිත විශේෂ ප්‍රාගුණ්‍යයතාවයෙන් යුත් පිරිස් ද ජීවත් ව සිටි බවට සනාථ වී ඇත. එමෙන් ම අසූව හා අනූව දශකයේ මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් අනුරාධපුර අභයගිරිය, ජේතවනාරාමය සහ පොළොන්නරු ආළාහන පිරිවෙන යන ව්‍යාපෘති ආශ්‍රිත පුරාවිද්‍යාත්මක කැණීම් මගින් හමු වූ දත්ත පුරාණ ලෝහ තාක්‍ෂණය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයවලින් හෙළිකරන කරුණු තවදුරටත් සනාථ කරයි. පොළොන්නරුවේ ආළාහන පරිවෙන් සංකීර්ණයේ රෝහල කැණීමෙන් හමු වූ ශල්‍ය වෛද්‍ය උපකරණ කට්ටලය මෙරට ලෝහ තාක්‍ෂණයේ සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය. යකඩ ලෝහයෙන් නිර්මාණය කරන ලද මෙම උපකරණ ක්‍රිස්තු වර්ෂ දොළොස්වන සියවසට පමණ අයත්යැ යි විශ්වාස කළ හැකි ය. ලෝහ තරාදි, විවිධ ප්‍රමාණයේ අඬු, කතුරු, හැඳි ආදිය හමු වී ඇත. සියුම් තියුණු කටු පවා හමුව තිබීම වැදගත් ය (Premathileke, 1988). අභයගිරිය ආශ්‍රිතව සිදුකරන ලද පර්යේෂණ මගින් ප්‍රදේශයේ තිබූ ලෝහ කාර්මික කම්හල් පිළිබඳ සොයා ගෙන ඇත. ලෝහ නිස්සාරණ උඳුන් හතක් අභයගිරි ස්තූපයට මීටර් 200 නිරිත දිගින් වන්නට සොයාගන්නා ලදී (පියරතන හිමි, 1994: 28-29). මීට අමතරව 1995 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ප්‍රංශ සහයෝගිතා ව්‍යාපෘතිය මගින් රිදීගම ආශ්‍රිතව යකඩ නිස්සාරණයට භාවිත කළ උඳුන් ද සොයා ගෙන තිබේ.

අනුරාධපුර නාගරීකරණ සමාජය ඉදිකිරීම් සහ විවිධ කර්මාන්ත සම්බන්ධයෙන් පමණක් නොව වෛද්‍ය ශාස්ත්‍රය සම්බන්ධයෙන් ද සිය විද්‍යාත්මක සහ තාක්ෂණික දැනුම යෙදවීමට උත්සුක විය. එයට හේතුව ඔවුන් සෞඛ්‍යාරක්ෂාව කෙරෙහි දැක් වූ උනන්දුවයි. පැරණි අනුරාධපුර නගරය ආශ්‍රිතව රෝහල් වෛද්‍ය උපකරණ සහ චිකිත්සක ක්‍රම ආදිය කෙරෙහි බල පෑ විද්‍යානුකූල ශිල්පක්‍රම සහ තාක්ෂණිකාංග

බොහෝය. මැදිරිගිරිය සහ මිහින්තලේ රෝහල් භූමියන්හි සහ රුවන්වැලි සෑය ථූපාරාමය රෝහල ආශ්‍රිත බෙහෙත් ඔරු ආදියත් මේ පිළිබඳ ඇති අගනා සාධකයන් ය. වෛද්‍ය කර්මය සඳහා භාවිත කරන ලද උපකරණ සහ මෙවලම් මිහින්තලේ වෙදහල ආශ්‍රිත භූමියෙන් හමු වී තිබේ. එනම් දේශීය වෛද්‍ය කර්මය සඳහා භාවිත කරන ලද බෙහෙත් ඔරු, බෙහෙත් ඇඹරුම්ගල්, ලෝහමය වෛද්‍ය උපකරණ මේ අතර වේ. ඖෂධ වර්ග කැපීමේ දී භාවිත කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ලෝහමය ගිරා කිහිපයක් ද සැත්කම් හෝ වෙනත් චිකිත්සක කර්ම සඳහා භාවිත කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි වෛද්‍ය උපකරණ කිහිපයක් ද මේ අතර වේ (චන්දිම හිමි, 2007: 115-116).

විසුද්ධිමාර්ගයේ ධර්ම කරුණක් විග්‍රහ කිරීමේ දී බුදුගොස් හිමියන් ලෙඩෙකු උපමාවට ගෙන තිබේ. එහි දක්නට ලැබෙන තොරතුරු අනුව බුදුගොස් හිමියන්ට කාය ව්‍යච්ඡේද විද්‍යාවේ දී හසල දැනුමක් තිබූ බව දැකගත හැකිය (විසුද්ධි මාර්ගය, 2015 : xix). ශ්‍රී ලංකාවේ ශල්‍ය වෛද්‍ය ක්‍රමයක් පිළිබඳව අපට මුල් වතාවට හමුවන්නේ බුද්ධදාස රජුගේ රාජ්‍ය සමයෙහි ය. ඒ අනුව මෙම ක්‍රමවේද ඉතා සුපරික්ෂාකාරීව සිදු කළ යුතුය. වර්තමානයේ ශල්‍ය කර්මයට භාජනය කරනු ලබන රෝගීන් සඳහා විවිධ ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරනු ලබයි. විශේෂිත වූ විෂබීජ හරණ ක්‍රමවේදයන් භාවිත කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව ඒ කාල පරිච්ඡේදය තුළ දී ද ඒ සඳහා විශේෂ ක්‍රමවේදයක් අනුගමනය කරන්නට ඇතැ යි සිතිය හැකිය. ''පසුව එක් දිනෙක රජ තෙමේ මඟුලැතු නැඟ නහනු පිණිස තිසාවැවට යන්නේ මහ මඟ පුත්තාභ නම් විහාරයාගේ පසෙක තුඹසක් මතුයෙහි කුස රෝගයෙන් පෙළෙන එක් මහ නයෙක් දිටී. බඩ හටගත් ගෙඩි රෝගය දක්වන්නට උඩුකුරුව හොත් නාගයා දැක නාග තෙමේ රෝගය යි, රජ තෙමේ නිශ්චය කොට සිතීය. නයා බඩ පළා පසුව දෝෂ බැහැරලා උතුම් බෙහෙත් කොට එකෙණෙහි ම ඒ සර්පයා සුවපත් කළේ ය'' (බුද්ධදත්ත හිමි, 1986 : 113-168).

සුශ්‍රැත සංහිතාව නම් වූ වෛද්‍ය ග්‍රන්ථයේ ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදයන් පිළිබඳව පුළුල්ව විග්‍රහ කරනු ලබයි. මෙම ග්‍රන්ථයේ සූත්‍රස්ථාන, නිධානස්ථාන, ශරීරස්ථාන, චිකිත්සිතස්ථාන, කල්පස්ථාන

හා උත්තරතන්ත්‍ර යනුවෙන් පරිච්ඡේද හයකින් යුක්ත වේ. සුශ්‍රැතයේ වෛද්‍ය මධ්‍යස්ථානය වූයේ බරණැස බව සඳහන් වෙතත් කතුවරයා සිටි කාලය පිළිබඳ මෙතෙක් නිශ්චිත නිගමනයක් තීරණය වී නැත. සුශ්‍රැත සංහිතාව ද වරෙක චරකගේ රචනා සම්ප්‍රදාය අනුගමනය කොට ඇත. එසේ ම මෙම ග්‍රන්ථයේ රෝග 120 ක් දක්වා ඇති අතර ඒවා තුවාල වැනි ශරීරය පෙළන රෝග, මානසික රෝග, ස්වාභාවික හේතු නිසා හට ගන්නා රෝග වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය (සුශ්‍රැත සංහිතාව, 2007 ඃ 64).

පුරාණයේ ද අද මෙන් වෛද්‍යවරුන් ඒ ඒ රෝග සඳහා විශේෂඥයන් වශයෙන් වර්ග කොට තිබූ බව දක්නට ලැබේ. අනුරාධපුර ජේතවනාරාම සලපතල මළුවේ තිබී හමු වූ ලිපියක ''අඳුන් වෙජ්'' යනුවෙන් සඳහන්ව තිබීමෙන් ඒ බව සනාථ වේ (හෙට්ටිආරච්චි, 2007 ඃ 253). ''අඳුන් වෙජ්'' යනු අක්ෂි වෙදකම කරන්නා වූ වෛද්‍යවරුන් බව අපට හඳුනා ගැනීමට හැකිවිය. චරක, සුශ්‍රැත වැනි භාරතීය ග්‍රන්ථවල මෙන් ම භේසජ්ජ මංජුසාව, යෝගාර්ණවය ආදී දේශිය ග්‍රන්ථවල ද අක්ෂි චිකිත්සාව වෙන වෙන ම දක්වා ඇත. මැදිරිගිරිය ශිලා ලිපියේ (EZ VII, 1969 ( 282) ''පුහුඩා වෙඳුන්'' යනුවෙන් කුඩැල්ලන් කැවීමේ රක්ත මෝෂණය මගින් ප්‍රතිකාර කරන සුවිශේෂි වෛද්‍යවරුන් පිරිසක් සඳහන්ව තිබීම මීට තවත් නිදසුනකි (කරුණාරත්න, 2004 ඃ 49-51). තව ද මෙම ශිලා ලේඛන මගින් පුරාණ වෛද්‍ය මධ්‍යස්ථාන පිහිටි ස්ථාන හෝ ප්‍රදේශ අනාවරණය කර ගැනීමට හැකියාව තිබීම ද මෙම අධ්‍යයනයේ දී වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ආරම්භ වූ සූතිකාගාර පිළිබඳ තොරතුරු මහවංසය ඇතුළු වංසකථාවල මෙන් ම උත්තර භාරතීය ආභාසය ලබා රචනා වූ චරක සංහිතා දී ග්‍රන්ථවල ද බොහෝ ප්‍රමාණයක් හමු වේ (චරක සංහිතාව, 1996 ඃ 388). සෙල්ලිපි සම්බන්ධයෙන් විමර්ශනයක යෙදෙන බද්දේගම විමලවංශ හිමියන් විසින් සඳහන් කරනු ලබන්නේ දුටුගැමුණු හා බුද්ධදාස වැනි රජවරුන් ආරෝග්‍ය ශාලා සඳහා විශේෂ අනුග්‍රහයක් දක්වා ඇති බවය. එමෙන් ම දරුවන් ප්‍රසූත කිරීමට සිටින මව්වරුන් සඳහා වින්නඹු සේවිකාවන් යොදවා ඇති බව ද පෙන්වාදී තිබේ (විමලවංස හිමි, 2016 ඃ 161). සූතිකාගාර තුළ ගර්භණී මවකට දරුවකු ප්‍රසූත කිරීමට පෙර හෝ පසු ඇයගේ වේදනාව වෙනුවෙන්


ලබා දීම සඳහා විවිධ ඖෂධ වර්ග සකස් කර ගැනීම සිදු කොට තිබේ. ඒ අනුව බෙහෙත් වර්ග ඇඹරීම හා කුඩු කර ගැනීම සඳහා ඇඹරුම්ගල් හා ශිලාමය වංගෙඩි භාවිත කොට තිබූ බව දක්නට ලැබෙන පුරාවිද්‍යාත්මක සාධක මගින් අනාරවරණය වේ. මහාවංසයට අනුව භද්දකච්චායනා කුමරිය පුතුන් දසදෙනෙකු හා එක් දියණියක බිහි කළ බව එම කතාපුවතෙන් අනාවරණය වේ. ''ඒ මෙහෙසි තොමෝ පුතුන් දස දෙනෙකු හා එක් දුවකුදු වැදුවා'' (මහාවංසය, 2012 : 01). මෙම උදාහරණය මගින් පැහැදිලි වන්නේ ඒ කාල පරිච්ඡේදය වන විටත් සෞඛ්‍යාරක්ෂණ කටයුතු සම්බන්ධ මිනිසාට විශාල අවබෝධයක් තිබූ බව ය. එමෙන් ම මෙහි දී අවධානය යොමු කළ යුතු පැතිකඩක් වන්නේ දරුවෙකු ප්‍රසූත කලායින් පසු පෙකණිවැල කැපීම සිදු කළ යුතු ය. ඒ සඳහා විෂබීජවලින් තොර ආරක්ෂාකාරී ක්‍රමවේදයක් අනුගමනය කළ බව ද දක්නට ලැබේ.

බුද්ධදාස රජු ශල්‍ය චිකිත්සාවේ දක්ෂයෙකු බව සඳහන් වේ. එනම් මැඩි බිජු සහිත වූ ජලය හදිසියේ පානය කළ පුද්ගලයකුගේ නාසයෙන් එම බිජුවක් ඉස්මුලට නැගී පසුව හිස් කබළ තුළ මැඩියෙක් හට ගැණින. එහිදී රජතුමා හිස්කබළ පළා මැඩියා ඉවතට ගෙන නැවත හිස් කබළ පුරුද්දා රෝගියා සුවපත් කළේය (රාමනායක, 2016 : 38). යනුවෙනි. මෙම නිදර්ශනය මගින් පැහැදිළි වන්නේ මේ කාල වකවානුව වන විට ශල්‍ය වෛද්‍ය විද්‍යාව ඉතා දියුණු මට්ටමක පැවැති බව ය. පොළොන්නරු අවධියේ රජ කළ පැරකුම් රජු වෛද්‍යවරුන්ට පවා අපහසු ශල්‍ය කර්ම කිහිපයක් ම සිදු කළ බව සඳහන් වේ. රජතුමා ශල්‍ය කර්මයෙහි යෙදුණු බවට එතුමා ශල්‍ය චිකිත්සාව ද මැනවින් හදාරා තිබූ බවට හා අනෙකුත් අයට ඉගැන් වූ බවට ද සාක්ෂියක් මහාවංසයේ හමු වේ. එනම් එම වෙදහලට කම්මුලේ හටගත් ගෙඩියක් නිසා දැඩි වේදනාවට පත් කවුඩෙක් පැමිණ ඇත. ඔහුගේ වේදනාබර කෑගෑම හැසිරීම් දුටු වෛද්‍යවරුන් රජුගේ විධානයෙන් උපදෙස් ලබා දී ඔහුට පිළියම් යොදා සුවපත් කර ඇත (රාමනායක, 2016 : 42).

### රෝහල්වලින් හමු වූ ශල්‍ය වෛද්‍ය උපකරණ

මිහින්තලා රෝහල් භූමියෙන් ශල්‍ය වෛද්‍ය උපකරණ කිහිපයක් හමු වී තිබේ. ඒවා කලක් තිස්සේ පොළව අභ්‍යන්තරයේ

තැම්පත් වී තිබීම හේතුවෙන් මළ බැඳ විනාශ වී තිබේ. නමුත් ඒම උපකරණයන් හඳුනාගත හැකි මට්ටමේ ශේෂව තිබේ. ඒ අතර කැපුම් සඳහා භාවිත කරන්නට ඇතැයි විශ්වාස කළ හැකි කුඩා පිහිතලයක්, මැහුම් සඳහා භාවිත කරන්නට ඇතැයි විශ්වාස කළ හැකි සියුම් උපකරණයක්, ගිරා කිහිපයක් මේ අතර වේ. මෙම උපකරණ නිර්මාණය කිරීම සඳහා යොදාගෙන ඇති මාධ්‍යය වන්නේ යකඩ ය. ශරීරයේ සියුම් කොටස් ඡේදනය කිරීම සඳහා මෙම තල උපයෝගී කොට ගෙන ඇති අතර ඡේදනයට ලක් කරන ලද කොටස් මැසීමට මැහුම් උපකරණ යොදාගෙන ඇති බව උපකල්පනය කළ හැකිය. මෙම උපකරණ සියල්ල දැනට මිහින්තලේ කෞතුකාගාරයේ තැම්පත් කොට තිබේ.




මිහින්තලේ රෝහලේ බිම් සැලැස්ම



මිහින්තලා රෝහලෙන් හමු වී ඇති ශල්‍ය වෛද්‍ය උපකරණ

පොළොන්නරු ආළාහන පරිවෙන් රෝහල් සංකීර්ණයෙන් ශල්‍ය වෛද්‍ය උපකරණ රාශියක් හමු වී තිබේ. එම උපකරණ අතර විවිධ හැඩයෙන් යුක්ත අඬු වර්ග, කතුරු වර්ග, ශල්‍ය කර්ම සඳහා යොදා ගන්නා කැපුම් උපකරණ, මැහුම් උපකරණ, ඇඹරුම් ගල්, බෙහෙත් වර්ග දැමීම සඳහා භාවිත තැටි වර්ග, බෙහෙත් ද්‍රව්‍ය කිරුම් මිණුම් සඳහා භාවිත තරාදිය ද ඒ අතර වේ. මෙම උපකරණ සියල්ල ම පාහේ නූතනයේ රෝහල්වල භාවිත කරනු ලබන වෛද්‍ය උපකරණවලට සමාන කමක් දක්වනු ලබයි.


01. ප්‍රොබ්ස් (Probes)

02. ෆොසෙප්ස් (Forceps)

03. ස්කැල්පල් (Scalpal)

යනුවෙන් හඳුන්වනු ලබන උපකරණ හා සමාන උපකරණත්, විවිධාකාරයේ කතුරු වර්ගත් දක්නට ලැබේ. මේ උපකරණ තනා ඇත්තේ ලෝකඩවලින් හෝ සුළු වානේ ප්‍රමාණයක් මිශ්‍ර කරන ලද යකඩවලිනි (ප්‍රේමතිලක, ප්‍රසන්න, 1982 : 16). වැදගත් වෛද්‍ය

විද්‍යාත්මක තොරතුරු රාශියක් හෙළි කරන මෙවැනි උපකරණ සහ ආයුධ මීට පෙර මෙරට කිසිදු පැරණි රෝහලකින් ලැබී නොතිබීම සුවිශේෂි කරුණකි. මෙසේ අනාවරණය කරගත් ශල්‍ය වෛද්‍ය උපකරණ අතර බෙහෙවින් මළ බැඳුණු එක් කතුරක් පමණක් රෝහල් ක්ෂේත්‍රයෙන් හමුවිය. කොක්කක් සහිත වූ තඹ වකුටු උපකරණයක් ද මේ අතර විය. එය ගඩු ඡේදනය කිරීමට හා තුවාල සුද්ද කිරීම සඳහා වූ වැදගත් වූ උපකරණයක් ලෙස පෙන්වාදිය හැකිය (සිරිවීර, 2004 ඃ 280). ආළාහන රෝහල් සංකීර්ණයෙන් හමු වූ විවිධ වර්ගයේ කැපුම්තල හා වෛද්‍ය උපකරණ සමග කුරක ආකාරයෙන් සකස් කර ඇති උපකරණයක් ද ඇත. එය යමක් ගැල්විමට හෝ තෙරපුම් කටයුතු වෙනුවෙන් යොදා ගන්නට ඇතැයි සිතිය හැකි වෛද්‍ය උපකරණකි.




පොළොන්නරුව රෝහලෙහි සැලැස්ම

මීට අමතරව ශල්‍ය කර්ම සඳහා භාවිතයට ගන්නට ඇතැයි විශ්වාස කරනු ලබන විවිධ ප්‍රමාණයේ අඬු, කතුරු හමු වී තිබේ. මෙම කැණීමෙන් අඬු වර්ග කිහිපයක් හමු වී ඇති අතර එකක අල්ලා ගන්නා අඬු දෙකෙන් එකක් කැඩී ඇත. එමෙන් ම ශල්‍ය වෛද්‍ය කටයුතු සඳහා යොදා ගන්නා ලද කතුරු කිහිපයක් හමු වේ. එහි ද අතෙහි රැඳවුම් තව්වෙහි කොටසක් කැඩී තිබේ. මෙම කතුර හමුවන විට ද බොහෝ සෙයින් හානයට ලක්ව තිබුණි. එය වර්තමානයේ රෝහල්වල දක්නට ලැබෙන කතුරුවලට සමාන කමක් දක්වනු ලබයි.



පොළොන්නරු රෝහල් භූමියෙන් හමු වී ඇති අඬු වර්ග



පොළොන්නරු රෝහල් භූමියෙන් හමු වී ඇති කතුරු

මෙම කැණීම් භූමියෙන් ගිරා කිහිපයක් ද හමු වී තිබේ. මේවා ඖෂධ වර්ග කපා ගැනීම හා සම්බන්ධ කාර්යයන් සඳහා යොදා ගන්නට ඇති බව උපකල්පනය කළ හැකිය. මීට අමතරව මිහින්තලේ රෝහල් සංකීර්ණයෙන් හා පොළොන්නරුව ආළාහන පිරිවෙන් සංකීර්ණයෙන් විවිධ වර්ගයේ ඇඹරුම් ගල් හා ගල් වංගෙඩි විශාල ප්‍රමාණයක් හමු වේ. ඒවා ඖෂධ වර්ග ඇඹරීම් හා කෙටීම් සඳහා භාවිත කර තිබේ. එමෙන් ම ඖෂධ වර්ග දැමීමට යොදාගත් විවිධ වර්ගයේ මැටි බඳුන්, ශිලාමය බඳුන් මෙම ස්ථානවලින් හමු වී තිබේ. බෙහෙත් කිරුම් මිණුම් ලබා ගැනීම සඳහා යොදාගත් සියුම් තරාදියක් ද මෙම රෝහල් සංකීර්ණයෙන් හමු වී තිබේ. 8 cm පමණ වන කඳක් සහිත මෙහි දෙකෙළවර අවසානයේ තරාදි තට්ටු එල්ලා තැබීමට හැකි වන පරිදි කුඩා සිදුරු දැකගත හැකිය. නමුත් මෙම තරාදි තට්ටු සොයාගත නොහැකි විය. රස දිය වැනි බැර ලෝහ ලෙස භාවිත කරන බලසම්පන්න ඖෂධ ද්‍රව්‍ය කිරීමට ඉතා කුඩා පරිමාණයේ මෙම තරාදිය භාවිත කරන්නට ඇත. මෙම තරාදියේ

කඳ කොටස තවමත් ක්‍රියාකාරී මට්ටමේ පවතී. හොඳින් සංරක්ෂිත හැන්දක් ද මෙම ස්ථානයෙන් හමු විය. ලෝහයෙන් නිමවා ඇති මෙහි මිට ලීයෙන් නිර්මාණය කර තිබෙන්නට ඇතැයි තීරණය කළ හැකිය. නමුත් කාලයාගේ අවෑමෙන් එහි සැබෑ ස්වරූපය වර්තමානයේ දී දැකගත නොහැකිය. කෙසේ හෝ ඖෂධ ද්‍රව්‍ය මිශ්‍රණයේ දී හෝ පරිහරණයේ දී මෙය භාවිතයට ගන්නට ඇතැයි විශ්වාස කළ හැකිය (ප්‍රේමතිලක, ප්‍රසන්න, 1982 : 27).



කැපුම් තල



තෙරපුම් කුරු





මැහුම් උපකරණ



ඖෂධ වර්ග වෙන් කිරීම සඳහා භාවිත ගිරා



තරාදියක කොටස්

## සමාලෝචනය

රජරට ශිෂ්ටාචාර සමයේ ශ්‍රී ලංකාවේ වාසය කළ මානවයාගේ සෞඛ්‍ය සංරක්ෂණීය කටයුතු වෙනුවෙන් භාවිත කළ ශල්‍ය වෛද්‍ය උපකරණ පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී එය ක්‍රි.පූ. 03 වන සියවසේ සිට ක්‍රි.ව. 12 වන සියවස දක්වා ගමන් කරනු ලබන බව දක්නට ලැබේ. මහාවංසය ආදී සාහිත්‍ය මූලාශ්‍රය තුළින් විවිධ රාජ්‍ය අනුග්‍රහය යටතේ වෛද්‍ය මධ්‍යස්ථාන බොහෝමයක් ඉදි කළ බවත්, එම රජවරුන් විසින් ශල්‍ය කර්ම සිදු කළ බවත් සඳහන් වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම් තුළින් අනුරාධපුර හා පොළොන්නරු යුගවල වෛද්‍ය මධ්‍යස්ථාන තුළ භාවිත කරන ලද ශල්‍ය වෛද්‍ය උපකරණ බොහොමයක් සොයාගෙන තිබේ. ඒ අතර ඖෂධ වර්ග කැපීම සඳහා භාවිත කළ ගිරා කැති, අඬු, කතුරු, කැපුම් තල, තෙරපුම් උපකරණ, මැහුම් උපකරණ වේ. ඒ අනුව සාහිත්‍ය මෙන් ම පුරාවිද්‍යාත්මක සාධක අධ්‍යයනය කර බැලීමේ දී මෙම යුගයන් තුළ ශල්‍ය වෛද්‍ය ක්‍රමවේදය ඉතා දියුණු මට්ටමක පැවැති බව දක්නට ලැබේ. එමෙන් ම මෙම යුගයන් තුළ නිෂ්පාදනය කරන ලද ශල්‍ය වෛද්‍ය උපකරණවල එක හා සමාන ලක්ෂණ දැකගත හැකි වන අතර ඒ ඒ යුගවල මිනිසා තුළ පැවැති සක්‍යතාවය හා තාක්ෂණික ඥානය උපයෝගි කොට ගෙන මේ සියලු කටයුතු නිර්මාණය වූ බව ලැබෙන සාධක අනුව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


කරුණාරත්න සද්ධාමංගල, (2000) *ශිලා ලේඛන සංග්‍රහය*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මුද්‍රණාය, කොළඹ.

කුමාරසිංහ ආරියදාස, (සංස්) (1996) *චරක සංහිතාව-තෘතිය භාගය* (ආයුර්වේද දෙපාර්තමේන්තුව) ගංගොඩවිල, නුගේගොඩ.

චන්දිම හිමි අම්බලන්තොට, (2007) *අනුරපුර පුරාණය*, තරුණ සේවා මුද්‍රණාලය, මහරගම.

ප්‍රේමතිලක පී.එල්, අලහකෝන්, උදිත් ප්‍රසන්න, (පරි) (1982) *ආළාහන පරිවෙන පොළොන්නරුව (තුන්වන පුරාවිද්‍ය කැණීම් වාර්තාව).*

බුද්ධදත්ත හිමි පොල්වත්තේ, (2012) පාලි සාහිත්‍යය, රත්න ප්‍රින්ටර්ස්, බත්තරමුල්ල.

බුද්ධදාස ආර්, (සංස්) (2007) *සුශ්‍රැත සංහිතාව*, ආයුර්වේද දෙපාර්තමේන්තුව, දීපානි මුද්‍රණය, නුගේගොඩ.

*බෞද්ධ ශබ්ද කෝෂය*, (සංස්) (2007) සිරි ලියනගේ, ඉදුරු ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, කොට්ටාව.

*මහාවංසය*, (2012) බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

රාමනායක ලීලා, (2016) පෙරදිග වෙද පුරාණය, දීපානි මුද්‍රණය, ගංගොඩවිල, නුගේගොඩ.

විමලවංශ හිමි බද්දේගම, (2016) *සෙල්ලිපි සමාජය*, ජනනි පබ්ලිකේෂක්, ඔෆ්සෙට් මුද්‍රණාලය, නුගේගොඩ.

*සංස්කෘතික පුරාණය (03 කලාපය)*, (2011) මධ්‍යම සංස්කෘතික අරමුදල, රාජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක.

සංස්කෘතික පුරාණය (5 වෙනි වෙළුම, 1 කාණ්ඩය), (2012) මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය, කොළඹ.

සිරි සුමංගල හිමි කොළොන්නාවේ, (2015) *විශුද්ධිමාර්ග විමර්ශනය,* (සංස්) ඉමාෂි ප්‍රින්ටර්ස්, ගංගොඩවිල.

හේවමානගේ, විමල්, (2008) බෞද්ධ ස්වස්ථතාව, සමයවර්ධන ශිල්පියෝ, මරදාන, කොළඹ.

*Epigraphia Zeylanica, Vol.I*, (2011) Department of Archaeology, Colombo.